# රණවිරුවා

2020 අප්‍රේල් • 216 කලාපය





## දරන් මව්බිම උරුම
## පුරන් කෙත් සරු කරන
## බලන් රණවිරු වරුණ

"සෞභාග්‍යයේ දැක්ම" නොව — "නැරු මිතුරු හව රටක්"

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# "රන් අස්වනු නෙළීමේ මංගල්‍යය"






ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ "තුරු මිතුරු නව රටක්" සංකල්පය යටතේ ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානය අසල මඩ වගුරු සහිත අක්කර 12 ක භූමි ප්‍රමාණයක් අභිනවයෙන් අස්වද්දා තැනූ වෙල්යායේ අස්වනු නෙළීම ඉකුත් අප්‍රේල් 30 දින සිදුකරනු ලැබීය.

හට පිරිස් විසින් මෙම වෙල්යායේ යන්ත්‍රෝපකරණ ආධාරයෙන් ජලය එකතු කරන ලද ඇළ මාර්ගයක් සකස් කර කාලයට ගැළපෙන පරිදි දුර්ලභ බීජ වර්ගයක් වන 252 රතු සම්බා තවාන් කරන ලදී.

තවද මෙම වෙල්යායේ බීජ වැපිරූ යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසගේම සුරතින් "රන් අස්වනු නෙළීමේ මංගල්‍යය" ද ආරම්භ කළේය. අදියර තුනක් යටතේ දියත් කරන ලද මෙම ව්‍යාපෘතිය යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ගේ සමීප අධීක්ෂණය යටතේ විධායක ජෙනරාල් ශාඛාව යටතේ ඇති 5 සහ 6 වන යුද්ධ හමුදා පොදු සේවා බළකා සාමාජිකයින් විසින් ක්‍රියාවට නංවා තිබුණි.

මෙම අවස්ථාවට යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් සහ යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.



# රෝගීන් නිරෝධායනයට තවත් සෙවණක්....







ගරු සෞඛ්‍ය ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ උපදෙස් මත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ඇතුලු නිලධාරීන් ගේ අධීක්ෂණයෙන් හලාවත, ඉරනවිල ප්‍රදේශයේ පිහිටි රජයට අයත් කොවිඩ් 19 වෛරසය ආසාධිත රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ වාට්ටුවක් ලෙස භාවිතා කිරීමට කටයුතු කරනු ලැබීය.

මෙතෙක් කාලයක් භාවිතයට නොගත් එම ගොඩනැගිල්ල තුළ වෛද්‍ය හේතූන් මත හුදෙකලා කොට නිරෝධායන කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය ඇඳන් 50 ක් වෙනුවෙන් ඉඩකඩ ඇති අතර, යුද්ධ හමුදාධිපති තුමන්ගේ උපදෙස් මත ලුතිනන් කර්නල් ආසිරි සුහන්දිරම් ගේ අධීක්ෂණය යටතේ 1 වන ඉංජිනේරු සේවා බලකායේ භට පිරිස් විසින් පවතින හදිසි අවශ්‍යතාවයට අනුව දින 05 ක් ඇතුළත මෙම ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම විශේෂත්වයකි.



# විරු දෑතින් නිම වූ සුව සෙවණක්...




ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි 1 වන ඉංජිනේරු සේවා බළකායේ සාමාජිකයින් විසින් ඉතා කෙටි කාලයක් තුළ මීගමුව ඉරනවිල ප්‍රදේශයේ පිහිටි "වොයිස් ඔෆ් ඇමෙරිකා" ගොඩනැගිලි සංකීර්ණය කොවිඩ් 19 රෝගය සඳහා ප්‍රතිකාර කරනු ලබන රෝහලක් ලෙස නවීකරණය කර ඉකුත් අප්‍රේල් 07 දින රාජ්‍ය නිලධාරීන් වෙත භාරදෙනු ලැබීය.



මෙහි සමාරම්භක උත්සව අවස්ථාව සඳහා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා පෝෂණ ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය, කොවිඩ් 19 පැතිරවීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය දේශපාලඥයින් සහ රාජ්‍ය නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.



# සුහද හමුවක මතක සටහන්...



ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ගෲප් කපිතාන් ෂෝන් අන්වින් මහතා පසුගිය අප්‍රේල් 17 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

මෙහිදී දෙදෙනා අතර පැවති සුහද සාකච්ඡාවේදී සෞඛ්‍ය බලධාරීන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණයෙන් කොවිඩ් 19 වෛරසය තවදුරටත් සම්ප්‍රේෂණය වීම වැළැක්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සිදුකරමින් පවතින වැඩපිළිවෙල පිළිබඳ ඔහු සිය සතුට හා ප්‍රසාදය පළකළේය.

---

දැනට ක්‍රියාත්මක කොවිඩ් 19 නිරෝධායන ක්‍රියාවලිය, බ්‍රිතාන්‍ය ජාතිකයින්ගේ තත්වය, සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් සාරා හල්ටන් මහත්මිය ඉකුත් මාර්තු 25 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවී සුහද පිළිසඳරක නිරත විය.



---



ලංකා සභාවේ අතිගරු දිලෝරාජ් රංජිත් කනගසබෙ කොළඹ අදරදගුරු පියතුමා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අතර හමුවක් ඉකුත් අප්‍රේල් 15 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

කොවිඩ් 19 වසංගතය පැතිරීම වැළැක්වීම වෙනුවෙන් ඉදිරියේදී ගතයුතු ක්‍රියාමාර්ග සහ ත්‍රිවිධ හමුදාව විසින් මහජනතාව වෙනුවෙන් මේ වනවිට සිදුකරනු ලබන කාර්යභාරය පිළිබඳව එහිදී දෙදෙනා අතර අදහස් හුවමාරු විණ.



# යුද්ධ හමුදාධිපතිගෙන් අලුත් අවුරුදු සුබපැතුම්....

"ඉතිහාසයේ තීරණාත්මක අවදියක මුලු ලෝකයම මෙම වසංගතයෙන් තර්ජනයට ලක්ව සිටින විට ඔබ කළ කැපකිරීම හා මිල කළ නොහැකි සේවය, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ආරක්ෂක ලේකම් තුමා සහ සියලු ශ්‍රී ලාංකිකයින් විසින් බෙහෙවින් අගය කරනු ලබනවා. සන්නද්ධ හමුදාවේ සේනාධිනායක අතිගරු ජනාධිපතිතුමන් විසින් මෙම කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානියා ලෙස මා පත්කර මෙම අභියෝගාත්මක කාර්යය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට භාර දුන්නේ ජාතියේ පැවැත්මට තර්ජනයක් එල්ලවූ සෑම අවස්ථාවකම "කළ නොහැක්කක් නොමැත" යන තේමාව මත පදනම්ව අපි, අපගේ කාර්යභාරය ඉහළින්ම ඉටුකර ඇති නිසාවෙනි"

- යුද්ධ හමුදාධිපති -

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් අප්‍රේල් 11 සහ 12 යන දෙදින උතුරු ප්‍රදේශයේ සංචාරයක නිරතවිය. එහිදී මුලතිව්, කිලිනොච්චි, යාපනය ප්‍රදේශවල සේවයේ නියුතු භට පිරිස් අමතා ඔවුනට අවුරුදු සුබපැතුම් එක්කළ යුද්ධ හමුදාධිපති තුමන් කොවිඩ් 19 ව්‍යසනය හමුවේ එකී සියලු රණවිරුවන් කළ අසීමිත කැපකිරීම් සුවිශේෂී ඇගයුමට ලක්කළේය.





යුද්ධ හමුදාධිපතිගේ යාපනය සංචාරයේ විශේෂ අවස්ථා







යුද්ධ හමුදාධිපතිගේ කිලිනොච්චි සංචාරයේ විශේෂ අවස්ථා





යුද්ධ හමුදාධිපතිගේ මුලතිව් සංචාරයේ විශේෂ අවස්ථා

# කොරෝනා මඩින්න දසතින් සහය...




බෞද්ධ විශාරද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පැපිළියාන ශ්‍රී සුනේත්‍රාදේවී රජමහා පිරිවෙන් විහාරස්ථානයේ වත්මන් ප්‍රධාන සංඝනායක මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නායක හිමිපාණන් විසින් කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථාන ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත මුහුණු ආවරණ 4100 ක් පරිත්‍යාග කිරීම පසුගිය අප්‍රේල් 15 දින සිදුකරන ලදී. දිවයින පුරා ස්වයං නිරෝධායන මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන යුද, නාවික සහ ගුවන් හමුදා සාමාජිකයින් විසින් ඉටුකරනු ලබන අතිමහත් කාර්යභාරය අගය කිරීම මෙම පරිත්‍යාගයේ අරමුණ විය.

---

306 සී/1 සිංහ සමාජයේ සාමාජිකයින් ඉකුත් අප්‍රේල් 15 දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී යුද්ධ හමුදා මූලස්ථානයේදී හමුවී ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා මුහුණු ආවරණ 5000 ක් පරිත්‍යාග කරන ලදී.

කොවිඩ් 19 වෛරසය පැතිරයාම වැළැක්වීම සඳහා ත්‍රිවිධ හමුදාව විසින් සිදුකරනු ලබන අවදානම් සහගත කාර්යභාරය පිළිබඳව අවදානය යොමුකළ සිංහ මහින්ද පෙරේරා සහ සිංහ නිහාල් ලියනආරච්චි යන මහත්වරුන් ඇතුලු එම සිංහ සමාජයේ සාමාජික සාමාජිකාවන් විසින් මෙම පරිත්‍යාගය සිදුකරන ලදී.



---



පසුගියදා ශ්‍රී ලංකා විදුලි උපකරණ ව්‍යාපාරිකයන්ගේ නියෝජිතයින් පිරිසක් යුද්ධ හමුදා මූලස්ථානයේ කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථාන ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවී සෞඛ්‍ය උපාංග තොගයක් පරිත්‍යාග කරන ලදී.

එම භාණ්ඩ තොගය අතර නිරෝධායන මධ්‍යස්ථානයන්හි කාර්ය මණ්ඩලවල, රෝහල්වල ප්‍රතිකාර ලබන ආසාදිත රෝගීන්ට, සන්නද්ධ හමුදා සහ සෞඛ්‍ය නිලධාරීන් හට භාවිතා කළ හැකි ආරක්ෂක උපකරණ කට්ටල 200 ක් සහ මුහුණු ආවරණ 200 ක් අඩංගු විය.

මෙම පරිත්‍යාග වැඩසටහන සඳහා ශ්‍රී ලංකා විදුලි උපකරණ ව්‍යාපාරිකයන්ගේ සංගමයේ සභාපති ධම්මික සමරවික්‍රම මහතා සහ එම සංගමයේ ලේකම් පී සේකර යන මහත්වරුන්ද එක්ව සිටියහ.



කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත ඩ්‍රෝන කැමරාවක් සහ උපකරණ කට්ටලයක් ලබාදීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ව්‍යවසාය සංවර්ධන සහ කර්මාන්ත හා සැපයුම් කළමණාකරන අමාත්‍ය විමල් වීරවංශ මහතා විසින් කටයුතු කරන ලදී. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී අදාළ පරිත්‍යාග භාරදෙනු ලැබීය.

---

ශ්‍රී ලංකාවේ දැවැන්ත ආරක්ෂිත හිස්වැසුම් නිෂ්පාදන ආයතනයක් වන *HHCO* ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම ඉකුත් අප්‍රේල් 24 දින කොවිඩ් 19 වෛරසය සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා කටයුතු කරන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ භාවිතය සඳහා හිස්වැසුම් 400 ක් පරිත්‍යාග කරන ලදී. අදාළ හිස්වැසුම් විෂබීජනාශකයක් යොදා පිරිසිදු කර නැවත භාවිතා කිරීමේ හැකියාවකින්ද යුක්තය.

කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථාන ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පසුගියදා මෙම පරිත්‍යාග භාරදෙනු ලැබීය. මෙම හිස්වැසුම් තොගය පරිත්‍යාග කිරීමේ අවස්ථාවට



*HHCO* ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගමේ චින්තක සංජීව ගනේගොඩ සහ එම සමාගමේ අලෙවිකරණ කළමනාකරු එම්කේඑම් සාරංග වෙලගෙදර යන මහත්වරු සහභාගි වූහ.

---



කොවිඩ් 19 වෛරසය සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා ත්‍රිවිධ හමුදාව සහ සෞඛ්‍ය නිලධාරීන් විසින් ඉටුකරනු ලබන කාර්යභාරය අගය කළ සෙලින්කෝ සමාගම් සමූහය, අත් සනීපාරක්ෂක, මුහුණු ආවරණ, උෂ්ණත්වමාන 21, අත්වැසුම් 1000, ආරක්ෂක කට්ටල 100 ක් සහ වෛරසය ආසාදනය වූවන්ට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කළ හැකි නවතම ආක්‍රමණශීලී නොවන වාතාශ්‍රයන් දෙකක් යුද්ධ හමුදා මූලස්ථානයේදී කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථාන ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පරිත්‍යාග කරන ලදී.

මෙම අවස්ථාවට සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ සභාපති ආර් රෙන්ගනාදන්, අධ්‍යක්ෂ ඩී කුරේ, අධ්‍යක්ෂ ජයවර්ධන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විජේසිංහ සහ සහකාර කළමණාකරු ජේ ප්‍රනාන්දු යන මහත්වරු සහභාගි වූහ.

# "දිරිය කතට අත්වැලක්"

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව දිස්ත්‍රික් 306 සී සිංහ සමාජය විසින් "දිරිය කතට අත්වැලක්" වැඩසටහන යටතේ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත මහන මැෂින් සහ රෝද පුටු පරිත්‍යාග කිරීමක් ඉකුත් මාර්තු 12 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.




දිරිය කතුන්ගේ ජීවන තත්වය නංවාලීම පිණිස සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට දිස්ත්‍රික් 306 සී සිංහ සමාජය නියෝජනය කරමින් දිස්ත්‍රික් 306 සී/1 සිංහ සමාජයේ දිස්ත්‍රික් අධිපති සිංහ මහින්ද පෙරේරා, එම කාන්තා සංසදයේ සිංහ දිලීපා පෙරේරා "දිරිය කතට අත්වැලක්" වැඩසටහනේ සභාපති සිංහ ක්ලියෝ පැට්රා විජේනායක, එම වැඩසටහනේ උප සභාපතිනී ශිරෝමි විජේනායක යන මහත්ම මහත්මීන් සහ සැපටි සිංහ සමාජයේ සිංහ සමාජිකාවන් ද සහභාගි වූහ.




මෙහිදී රුපියල් ලක්ෂ දෙකහමාරක පමණ වටිනාකමකින් යුතු මහන මැෂින් 08 ක් සහ රෝද පුටු 02 ක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය වෙත සංකේතාත්මකව භාරදීම සිදුකරන ලදී.



# නව මුළුතැන්ගෙයි ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණයක...

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය අප්‍රේල් 28 දින යුද්ධ හමුදා මූලස්ථානයට යාබදව ඉදිවෙන මුළුතැන්ගෙයි ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කිරීමට එක්විය.

පාර්ලිමේන්තු වතුරස්‍රයට ආසන්නයේ පිහිටි මෙම නව අංගසම්පූර්ණ මුළුතැන්ගෙය ඉදිකෙරෙන පරිශ්‍රය තුළ යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සෙසු නිලයින් 4000 කට පමණ ආහාර සැපයීමේ හැකියාව පවතී. වර්තමානයේ එම ආහාර පිසීම නාරාහේන්පිට සිදුකරනු ලබන අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ආපනශාලාව හරහා සහනදායි මිල ගණන් යටතේ සෙසුනිලයින් හට ආහාර සැපයීම සිදුකරයි.



යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සියලුම සෙසුනිලයින් සඳහා උසස් තත්වයේ උණුසුම් ආහාර වේලක් ලබාදීම මෙම මුළුතැන්ගෙය ඉදිකිරීමේ අරමුණ වන අතර, 14 ඉංජිනේරු සේවා බළකාය එහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබයි.

මෙම අවස්ථාව සඳහා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් සහ නඩත්තු හා කළමණාකරන අධ්‍යක්ෂ ඇතුලු පිරිසක් ද සහභාගි වූහ.

## විරු දරු දැරියන්ගේ සුරු විරුකම්...







යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ජීවත්වන රණවිරුවන්ගේ සුබසාධනය උදෙසා ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන අතර, ඒ සඳහා යුද්ධ හමුදා නොවන අයවලුන්ගේ දරුවන් හටද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දී ඇත. ඒ අතරින් මැනිංටවුන් විරු කැකුළු පෙර පාසලේ ඉගෙනුම ලබන දරු දැරියන්ගේ එළිමහන් ක්‍රියාකාරකම් ඔප්නැංවීමේ අරමුණින් සංවිධානය කරන ලද විශේෂ ක්‍රීඩා ඉසව්වලින් සමන්විත වාර්ෂික ක්‍රීඩා උත්සවය මෙවර ඉකුත් මාර්තු 11 දින එම පෙර පාසල් ක්‍රීඩාංගනයේදී සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණී සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහි දරු දැරියන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමද සභාපතිණියගේ සුරතින් සිදුවිය.

## සන්නාහ සන්නද්ධ බළකා සේවා වනිතා ශාඛාව...



මුලු විශ්වයම වෙළාගත් කොවිඩ් 19 වෛරසයෙන් අපහසුතාවයට පත් කහටගස්දිගිලිය, හේනකට්ටිය ගම්වාසී පවුල් 60 ක් සඳහා රුපියල් 3000.00 කට අධික වටිනාකමකින් යුත් වියළි සලාක ඇතුළත් පෝෂණ මලු පරිත්‍යාග කිරීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 21 දින පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උප සභාපතිණිය මෙන්ම ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණී ශිරෝමි ලියනගේ මහත්මියගේ උදාර සංකල්පයක් මත සිදුකෙරුණු එම මාහැඟි කටයුත්තට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් මෙන්ම නිලධාරීන්, සෙසුනිලයින් රැසක් ද එක්වූහ.

---

## කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව...

කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ පෙබරවාරි මාසික රැස්වීම පනාගොඩ කාලතුවක්කු හමුදා සේවා වනිතා කාර්යාලයේදී පැවැත්විණ. එම සාකච්ඡාවෙන් අනතුරුව එහි සභාපතිණී කුමුදුනී වනිගසූරිය මහත්මිය විසින් එම රෙජිමේන්තු ක්‍රීඩා කණ්ඩායම වෙත කැසිලන් 90 ප්‍රෝටීන් අතිරේක පැකට් 1200 ක් පරිත්‍යාග කිරීම ද සිදුකරන ලදී. මෙම පරිත්‍යාගය සඳහා ප්‍රධාන අනුග්‍රහය දරන ලද්දේ ස්ටැසන් සමූහ ආයතනය විසිනි.




---

## සංඥා බළකා සේවා වනිතා ශාඛාව...





ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කළ ශිෂ්‍යාධාර පිරිනැමීමේ වැඩසටහනක් හා රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ක්‍රීඩා කුසලතා ඇගයීම වෙනුවෙන් වූ ත්‍යාග ප්‍රදානෝත්සවයක් පසුගියදා රෙම ශ්‍රීලංසංබ සෙසුනිල භෝජනාගාරයේදී පවත්වන ලදී. එහිදී මියගිය රණවිරුවන්ගේ සහ රාජකාරියේ යෙදී සිටින රණවිරුවන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව හිමිගැන්විණ. මෙම වැඩසටහන ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය කේෂිණී හෙට්ටිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

## විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව...



විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ වැඩමුලුවක් ඉකුත් මාර්තු 06 දින සීතාවක "මිරකල් නේචර් රිසෝට්" හිදී උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ප්‍රියදර්ශනී සිරිනාග මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු එම වැඩමුලුවේදී ඊට සහභාගි වූ සේවා වනිතා සාමාජිකාවන් හට "ප්‍රීතිමත් දිවියක්" යන තේමාව යටතේ ප්‍රවීන දේශක ඒජීඑස් සේනාධීර මහතා විසින් හරවත් දේශනයක් පවත්වන ලදී.

මියුරු සංගීත වැඩසටහනක්ද සමගින් දිනය පුරා පැවති එම වැඩමුළුවේදී සේවා වනිතා සාමාජිකාවන්ගේ දරු දැරියන් සඳහා ත්‍යාග බෙදාදීමක්ද සිදුකරන ලදී.

## ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



"සිංහ දිරිමග" වැඩසටහන් මාලාවේ තුන්වන දිනය ඉකුත් පෙබරවාරි 22 දින සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනී ප්‍රියමාලි මුදන්නායක මත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුකරන ලදී.

එහිදී 2020 සහ 2021 යන වර්ෂයන්හි විශ්‍රාම යනු ලබන සිංහ විරුවන් සඳහා හරවත් දේශනයක් ලසන්ත කාරියප්පෙරුම යන අය විසින් සිදුකරන ලද අතර, එම අවස්ථාවට පැමිණ සිටි අයවලුන්ගේ රසාස්වාදය උදෙසා එදින සංගීත වැඩසටහනක්ද පවත්වන ලදී. ඒ සඳහා ප්‍රවීණ රංගන ශිල්පීන් හා ගායක ගායිකාවන්ද සහභාගි වූහ.





## විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව

2020 වසරේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් විජයබාහු පාබල රෙජිමේන්තුවේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහතුන් හට වියලි ආහාර පාර්සල් පිරිනැමීමේ උත්සවයක් එම රෙජිමේන්තුවේ අධිපති මේජර් ජෙනරාල් ආර්කේබීඑස් කැටකුඹුර ආර්එස්පී සහ විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය දමයන්ති කැටකුඹුර මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 15 දින පවත්වන ලදී.



එහිදී සිවිල් සේවක මහතුන් 60 දෙනෙකු වෙත රුපියල් 3600.00 ක් පමණ වටිනා වියළි සළාක පාර්සලය බැගින් පරිත්‍යාග කරන ලදී.

විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති එම අවස්ථාවට සේනාවිධායක, නිලධාරීන් ඇතුලු සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.



# සිතුවිලි සාගරය


## රණවිරුවාණෙනි...

අවි අත දරා නිතරම නිදි වරන්නේ
දේශයෙ මුර දේවතාවෝ කියන්නේ
සෝදිසියෙන් නිති කටයුතු කරන්නේ
විරුවාණෙනි ඔබෙ නම ලක දිලෙන්නේ

රණ බිමේදී බාධක මැද ඉදිරියටම ඇදුනේ
රට ජාතිය ගැනමයි නිතරම කටයුතු කෙරුවේ
කුසට අහර නෙතට නින්ද කිසිවිට නෑ පැතුවේ
විරුවාණෙනි ඔබෙ නාමය දිලුනා ලක් දෙරණේ

මරුවා හට කිසි විටෙකදි නෑ ඔබ බිය වූයේ
එඩිතර බව ඔබේ ගතේ නිරතුරුවම රැඳුනේ
රට වෙනුවෙන් නිබඳව පය ඉදිරියටම තැබුවේ
රන් අකුරෙන් ඔබෙ නාමය ලියැවෙයි ඉතිහාසේ

කේඑච් චතුනි චමත්කා
6 - සී ශ්‍රේණිය
බප/කැල මහමායා බාලිකා විද්‍යාලය
කඩවත



සෙ/1ජේ00867
ලා/කෝප්‍රල් බංඩාර ආර්එම්එන්
ශ්‍රී ලංකා රයිෆල් බලකාය
යුහ කඳවුර, පල්ලෙකැලේ

## ආදරණීය නුඹ...

ජීවිතයේ කටෝර බව
දැනි දැනී කඳුළු මත
වටිනාකමින් මිදී දිවියට
ඈතට යනෙන විට හැමදෙය
වටිනාකම් රැසක් එකතු කර
ජීවිතයට හුස්ම දී මට
ගෙනා නුඹ මගේ හිල් අහසට
පුන් සඳක්ම විය..

ගැරහුම් මට එමට ලොවෙතින්
කතා කටකතා ගෙතුමෙන්
වියා වියමන් පදවැල්
කියා නෙතු සිත් රිදුමන්
නුඹ පැමිණා ඉරා ඒ කියමන්
ගෙතුවා අලුත් වියමන් මා නමින්
සදා නොදිරන නූලකින්
මධුසඳක් හිල් ගුවනෙ නන්
මහ පොළොව මත බබලවමින්
නුඹ ඇවිද ආදරයෙන්

දහක් දේ කතා කියූ මිනිසුන්
දහස් පැතුමන් නුඹ මට ගෙන අභිමන්
ගෙන ආ මගේ දිවියට සදා ආදරෙන්
භවෙන් භවයේ පතා එන පැතුම විලසින්
පතමු එකලෙස නිවන් යන තුරු
වෙන්න නුඹ මගෙ හුස්ම විලසින්...

සෙ/653614
සාසෙ සඳමාලි ජේඒආර්
5 ශ්‍රීලයුවෙබ
යුද හමුදා රෝහල - නාරාහේන්පිට



## තනිකම...

සීත සුළං මැද
ඝණ අඳුර ගිල යන සඳ
තනිව හිඳ මම
ගනිමි දින ගන
ජීවිත ගමන ගැන
පතනෙමි තනිව මම
තනිකම මකන්නට
කවිරුන්ද එන මග...

සෙ/ඊ100739
රසෙ ප්‍රේමචන්ද්‍ර ඩීඩබ්ලිව්එච්
3(සෙව්) ශ්‍රීලංසිරෙ
ඉහල වැව - නුවරඑළිය

## මම නැති කෙනෙක්...

ඔබට ඔබම මෙන් තවත්
දහස් ගණනක්
ලක්ෂ ගණනක්
කෝටි ගණනක්
ප්‍රකෝටි ගණනක්
අනන්ත වූ සසරේදී මුණගැසේවි
ඔබට මේ මුණගැසීමේදී
මම මෙන් නැති කෙනෙක්
මුණගැසේවි එම දුර්ලභ මොහොත
මග නොහරින්න එවිට ඔහු ඔබට
සසරින් ගැලවෙන මග කියාවි
මේ දුර්ලභ මොහොත
මග හැරුනොත් ඔබට තවත්
දහස් ගණන
ලක්ෂ ගණන්
කෝටි ගණන්
ප්‍රකෝටි ගණන් මුණගැසේවි
ඒ ඔබව සසරේම තබා ගන්න

අජන්ත හේරත් මයා
අයවැය හා මු.ප අම

# ආරක්ෂක ලේකම්ගේ යාපනය සංචාරය...

ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා ඉකුත් අප්‍රේල් 17 දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බළ ප්‍රදේශයේ සංචාරයක නිරත විය. එහිදී යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ගෞරවනීය පිළිගැනීමෙන් අනතුරුව එතුමන් පලාලි ගුවන් හමුදා කඳවුරේදී එම බළ ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන යුද, ගුවන්, නාවික, පොලිස් සහ විශේෂ කාර්ය බළකායේ සියලු භට පිරිස් අමතන්නට ද අමතක නොකළේය.








# කොරෝනා මැඩලීමට මුල්වෙමින්...







යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ උපදෙස් පරිදි රට පුරා සීඝ්‍රයෙන් පැතිර යන කොරෝනා වෛරසය යාපනය අර්ධද්වීපයේ ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා 51, 52 සහ 55 සේනාංක බළප්‍රදේශයන්ට අයත් බස් හා දුම්රිය ස්ථාන, තැපැල් කාර්යාල, රෝහල්, පොදු වෙළඳ සංකීර්ණ, රාජ්‍ය ආයතන, යාපනය විශ්වවිද්‍යාලය, රාජ්‍ය හා පුද්ගලික බැංකු, ෆාමසි ඇතුලු මහජනතාව බහුලව ගැවසෙන ස්ථාන විෂබීජහරණය සිදුකරන ලදී.

# ආරක්ෂක ලේකම්ගේ වන්නි සංචාරය...

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා එම තනතුරෙහි රාජකාරී භාරගැනීමෙන් පසු ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයෙහි රාජකාරී කරනු ලබන ත්‍රිවිධ හමුදා, විශේෂ කාර්ය බළකා හා පොලිස් නිලධාරීන් ඇමතීම ඉකුත් අප්‍රේල් 17 දින ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හිදී සිදුකරන ලදී.

එම අවස්ථාවට 300 කට අධික භට පිරිසක් සහභාගි වූ අතර, අවසානයේ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී විසින් ආරක්ෂක ලේකම් තුමා වෙත සමරු තිළිණයක්ද ප්‍රදානය කරන ලදී.







# කොරෝනා මැඩලීමට පරිත්‍යාගයක්...



මිහින්තලේ රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය වලවාහැන්ගුණවැවේ ධම්මරත්න නායක හිමිපාණන් විසින් කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජනාධිපති කාර්ය සාධන බළකා අරමුදලට වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය හරහා රුපියල් මිලියනයක පරිත්‍යාගයක් සිදුකරන ලදී. එහිදී ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී විසින් එම අරමුදල භාරගන්නා ලද අතර, එම අවස්ථාවට මිහින්තලේ රජමහා විහාරයේ භික්ෂූන් වහන්සේලා, 21 සේනාංකයේ සේනාංකාධිපති ඇතුලු නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

# ආරක්ෂක ලේකම් නැගෙනහිර සංචාරයක...

කොවිඩ් 19 වෛරසය දිවයින පුරා පැතිරීම වැළැක්වීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටුකරනු ලබන ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් අගය කිරීමට සහ ඔවුන් වෙත අලුත් අවුරුදු සුබපැතුම් පිරිනැමීම පිණිස ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා ඉකුත් අප්‍රේල් 17 දින නැගෙනහිර ප්‍රදේශයේ සංචාරයක නිතර විය. පවත්නා හදිසි තත්වය මත සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරීම සඳහා බොහෝ දෙනෙකුට සිය නිවෙස් වෙත යාමට නොහැකි වුවද, ඔවුන් සියලු දෙනා සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමග අලුත් අවුරුදු සතුට බෙදාහදා ගැනීමට ආරක්ෂක ලේකම් තුමන් එහිදී අමතක නොකළේය.







මෙම සංචාරය සංකේතවත් කිරීම වස් ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී විසින් ආරක්ෂක ලේකම් වෙත සමරු තිලිණයක්ද ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට නැගෙනහිර නාවික ප්‍රදේශයේ ආඥාපති, නැගෙනහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, සේනාංකාධිපතිවරු, ඉදිරි නඩත්තු පෙදෙස නැගෙනහිර ආඥාපති, චීනවරාය පිහිටි ගුවන් හමුදා විද්‍යා පීඨයේ සේනාවිධායක ඇතුලු ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද එක්වූහ.

---

## ඩෙංගු උවදුරට වැටබඳී...





22 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඅයි මාරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ ඉකුත් අප්‍රේල් 13 දින ත්‍රිකුණාමලය මනියාවේලි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙතින් සංවිධානය කරනු ලැබූ ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා 221 බළසේනාව යටතේ ඇති 2(සේවා) ගජබා රෙජිමේන්තු භට පිරිස් පූර්ණ සහයෝගය ලබාදුන්හ. මෙම වැඩසටහන අතරතුර නිවාස 241 ක් පරීක්ෂාවට ලක්කරන ලද අතර, මදුරු කීටයින් බෝවන ස්ථාන සහිත හඳුනාගත් නිවාස හිමියන් 05 දෙනෙකු හට එරෙහිව නීතිමය පියවරද ගනු ලැබීය.

# "උතුර දකුණ යා කරන සංහිඳියාවේ සිතුවම් පවුර"

65 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස්වලට අනුව "උතුර දකුණ යා කරන සංහිඳියාවේ සිතුවම් පවුර" යන තේමාව යටතේ සංවිධානය කරන ලද මල්ලාවි මධ්‍ය මහා විද්‍යාලීය තාප්පයේ චිත්‍ර ඇඳීමේ වැඩසටහනක් පසුගියදා ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව මෙම අවස්ථාව දැකබලා ගැනීම සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි වූ අතර, "කොලොම්තොට වියත්මග" සංගමයේ සභාපති මාහාචාර්ය සුරතිස්ස දිසානායක මහතා ඇතුලු චිත්‍රකරුවන් පිරිසක් සහභාගි වූහ. මේ සඳහා යුද්ධ හමුදාව නියෝජනය කරමින් 19 ශ්‍රී ලංකා පාබල හමුදාව, 1 වන විශේෂ බළකාය, 7 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය, 17(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව, 4(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට අයත් හටපිරිස් සහයෝගය ලබාදුන් අතර, මල්ලාවි මධ්‍ය මහා විද්‍යාලයේ ගරුවරුන්, ආදි ශිෂ්‍යයින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් ඇතුලු මල්ලාවි ප්‍රදේශයේ චිත්‍ර ශිල්පීන් ද ඊට දායකත්වය දක්වන ලදී.





# සිවිල් ජනයා වෙත සහන රැසක්...





කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයට අයත් 65 වන සේනාංකය යටතේ සේවයේ නියුතු හට පිරිස් විසින් පරිත්‍යාගශීලීන් කණ්ඩායමක් සමග එක්ව පොන්නගර්, වේලන්කුලම් සහ උයිලන්කුලම් ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් වෙත රුපියල් මිලියනයක වටිනාකමකින් යුත් වියළි ආහාර මලු බෙදාදීමේ සත්කාරයක් පසුගිය අප්‍රේල් 11 දින සිදුකරන ලදී.

ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ 65 සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීමෙන් සිදුකළ එම කටයුත්තට එම ප්‍රදේශවල ග්‍රාම නිලධාරීන්ගේද නොමඳ සහය හිමිවිය.

# කෝකිලායි ධීවරයින්ගෙන් යුද්ධ හමුදාවට පරිත්‍යාගයක්.....





59 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සංකල්පයකට අනුව 593 බළසේනාධිපති කර්නල් වසන්ත පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සම්බන්ධීකරණයෙන් 59 සේනාංක බළප්‍රදේශයට අයත් කෝකිලායි ධීවර ව්‍යාපාරිකයින් විසින් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පරිභෝජනය උදෙසා මාළු කිලෝ 1200 ක ප්‍රමාණයක් පරිත්‍යාග කිරීමේ මාහැගි කටයුත්තක් කෝකිලායි කරණාටකේණි ප්‍රදේශයේ දේදුණු වාඩිය අසලදී පසුගියදා සිදුකෙරිණ. අදාළ පරිත්‍යාගයන් භාරගැනීමේ අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ සමගින් 59 සේනාංකාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගි වූහ. එහිදී මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා මහගු සහයක් ලබාදුන් ධීවර ව්‍යාපාරික රුක්මල් තුෂාර ලිවේරා, ජනක ඩයස් සහ දේදුණු ඩයස් යන මහත්ම මහත්මීන්ට ආරක්ෂක සේනා ආඥාපති හා 59 සේනාංකාධිපතිගේ විශේෂ ස්තුතිය හිමිවූහ.

අදාළ මාළු තොගය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය හරහා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුබසාධනය පිණිස බෙදා හැරීමට නියමිතය.

---

# සිවිල් ජනයා වෙත සහන සලසයි...

683 බළසේනාවේ බළසේනාධිපති කර්නල් නලීන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම බළසේනාව, 7 වන ගැමුණු හේවා බළකාය සහ 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ දායකත්වය මත 683 බළසේනා ප්‍රදේශය තුළ කොවිඩ් 19 වසංගතය නිසා අසරණ වී සිටින දිළිඳු ජනයා වෙත වියළි සහ අමු සළාක ඇතුළත් සහන මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 23 දින 683 බළසේනා මූලස්ථානයේ දී පවත්වන ලදී. මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ ගේ සංකල්පයකට අනුව 68 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ මෙම සත්කාරය සිදුකෙරිණ.









# යුද්ධ හමුදාධිපති උතුරේ නාවික සහ ගුවන් භටයින්ගේ සේවය අගයයි...



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් අප්‍රේල් 12 දින පලාලි ගුවන් හමුදා කඳවුරේ සහ උතුරු නාවික කඳවුරේ සේවයේ නියුතු සියලු භට පිරිස් හමුවී අලුත් අවුරුදු සුබපැතුම් එක්කළ අතර, ඔවුන් සමග අලුත් අවුරුදු උදාවේ සතුට බෙදා ගැනීමට ද අමතක නොකළේය.











# තාරවිකුලම් හි යුද්ධ හමුදා සාමාජිකයින්ට යුද්ධ හමුදාධිපතිතුමාගේ සුබ පැතුම්...







කොවිඩ් 19 වසංගත පැතිරීමට එරෙහි සටනේ පෙරමුණ ගෙන සිටින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් අප්‍රේල් 11 දින සොබ්‍ය අංශයේ විශේෂඥයින් සහ නිලධාරීන් සමග මන්නාරම බලා පිටත්ව ගියහ. එහිදී හුදෙකලා වූ තාරවිකුලම් ගම්මානය සහ එහි රාජකාරියේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සිය ගණනක් වෙත නව වසර වෙනුවෙන් සිය සුබපැතුම් එක්කළ ඔහු, ඔවුන් විසින් සිදුකරනු ලබන මෙම ජාතික මෙහෙවරට සිය කෘතඥතාව පළ කළේය.

# පින් බිමට සත්කාරයක්...

මේ දිනවල සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින කොරෝනා වෛරසය හේතුවෙන් අපහසුතාවන්ට ලක්ව හෝමාගම, පනාගොඩ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ නේවාසිකව ඉගෙනුම ලබන විදේශීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 89 ක් සඳහා වියළි ආහාර සහ අමු සළාක තොගයක් පසුගිය අප්‍රේල් 04 දින පිරිනැමිණ. අදාළ පරිත්‍යාග බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එම විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්‍ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි හා යෝගානන්ද හිමි වෙත එම විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී භාරදෙනු ලැබීය.

එම පරිත්‍යාග කරනු ලැබූ ආහාර ද්‍රව්‍ය 306/සී01 දිස්ත්‍රික් ජාත්‍යන්තර සිංහ සමාජයේ සිංහාධිපති සිංහ මහින්ද පෙරේරා, එස්කේ මුණසිංහ ආයතනයේ අධිපති සහ ශ්‍රී බෝසත් ආර්යශ්‍රාවක පදනම මගින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) වෙත ලබාදී තිබිණ.









යුද්ධ හමුදා බෞද්ධ බල මණ්ඩලයේ සභාපති මෙන්ම ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ප්‍රදේශයේ විහාරස්ථාන 16 ක වැඩ සිටින භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වියළි සහ අමු සළාක ප්‍රදානය කිරීම ඉකුත් අප්‍රේල් 06 දින සිදුකරන ලදී.

ඒ අනුව ආඥාපති විසින් කෝට්ටේ කල්‍යාණී පාර්ශවයේ ප්‍රධාන සංඝනායක ඉත්තෑපානේ ධම්මාලංකාර නායක ස්වාමීන් වහන්සේ වෙත මෙම සළාක නිල වශයෙන් ලබාදීම රුක්මල්ගම ධර්මච්ඡායාලෝක විහාරස්ථානයේදී සිදුකරන ලද අතර, එයට සමගාමීව තවත් විහාරස්ථාන 15 ක් වෙත ද වියළි සහ අමු සළාක පිරිනැමුණි.

# ආඥාපතිගේ සේනාංක සංචාරය...



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ඉකුත් අප්‍රේල් 23 දින 12 සේනාංක මූලස්ථානය සහ ඒ යටතේ ඇති බලසේනා මූලස්ථානවල සංචාරයක නිරත විය. එම අවස්ථාවට 12 සේනාංකාධිපති, 121 සහ 122 බලසේනාධිපතිවරුන් මෙන්ම තවත් නිලධාරීන් රැසක්ද සහභාගි වන ලදී. එම සංචාරයේදී ආඥාපති විසින් රුක් රෝපණයක් ද සිදුකළ අතර, සමූහ ජායාරූපයකටද සහභාගි විය.





## නවෝත්පාදන නිර්මාණයක්...



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි කොවිඩ් 19 වෛරසය පැතිරීම වැළැක්වීම වෙනුවෙන් ආරක්ෂක සේනා ඉංජිනේරු කාර්යාලය විසින් කළ නවෝත්පාදනයක් ලෙස විෂබීජ නාශක කුටියක් නිර්මාණය කර ඇති අතර, අදාළ විෂබීජ නාශක කුටිය නිරෝධායන මධ්‍යස්ථානවල රෝගීන් පරීක්ෂාකර වෛද්‍යවරුන්ගේ විෂබීජහරණ කටයුතු වෙනුවෙන් යෙදවීමට නියමිතය.



**යුධ භූමියක තෝරා ගැනීම් මහ ගොඩක් නැහැ. ලැබෙන සීමිත අවස්ථාවන් තුළ ශිල්පයේ දක්ෂ බවත් වාසනා ගුණයත් අනුව කෙනෙකුගේ ජීවිතය රැකෙන එක තීරණය වෙනවා. අද අපේ රට හමුවේ එල්ල වී ඇති තර්ජනය දෙස බැලීමේදී අවසන් මොහොතෙත් අපිට සීමිත අවස්ථාවක් ලබාදී තිබෙන බව පේනවා. ඒ නිසා අපි ඒ අවස්ථාව හරියට පාවිච්චි නොකලොත් බොහෝ අනිසි ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්න වෙනවා. හැම කෙනෙකුටම අවදානම දැනගෙන වගකීමෙන් හැසිරීමේ වැදගත්ම යළි යළි මතක් කරන්නෙ ඒකයි.**

# ලද අවස්ථාව අපතේ නොහරිමු...

"අඛණ්ඩව එල්ල වන සතුරු ප්‍රහාර, මොහොතින් මොහොත වැඩිවන තුවාලකරුවන් සංඛ්‍යාව, ආධාරක හට පිරිස් නොපැමිණීම හා කුසගින්න හේතුවෙන් එහි සිටි සෑම සෙබළෙකුම පත්ව සිටියේ ඉමහත් ව්‍යාකුල තත්වයකටය. සැලසුම් සහගත බව වෙනුවට සෑම දෙයක්ම කලවම් වුණු ස්වභාවයක් එහි දිස්විය. අවි ආයුධ පතුරම් යහමින් තිබුණද ඒ ඒ මට්ටම් වල පැවති නායකත්වයේ හිඩැස් හේතුවෙන් සටන් වදින සෙබලුන් ඒකරාශි කරවා තැබීම හා ඔවුන් මෙහෙයවීම ගැටලුවක්ව පැවතිණි. කෙසේ වුවද සහයක හට පිරිස් පැමිණෙමින් සිටින බවට වූ ආරංචිය සැලවීමත් සමග ඉදිරි පෙළ සටන් වදින හටපිරිස් තුළ කිසියම් බලාපොරොත්තුවක් දැල්වෙන්නට විය. මේ අතර ත්‍රස්තවාදීන්ගේ මෝටර් ප්‍රහාර අතොරක් නැතිව ප්‍රදේය පුරා පතිත වද්දී ඇතැම් තැන්වල ඒවායින් සෙබලු බුරුතු පිටින්ම තුවාල ලැබූහ. එහිදී විශාල හානියක් සිදුවුනත් සෙබලු සටන අත්නොහැරියේ ආධාරක හට පිරිස් පැමිණෙමින් සිටින බවට ලද ආරංචිය නිසාමය.

සටන් ඇවිලී දෙවන දිනය උදා වූයේ රාත්‍රිය මුලුල්ලේ පැවති තරමක නිහඬ බවකින් අනතුරුවය. ඒ වන විට උරෙන් උර ගැටෙන තරමට ලංව එහි වූ ආරක්ෂක වලල්ල ආවරණය කර සිටි සෙබළ පිරිස සියයක් පමණ වූහ. එහිදි කඳවුරේ කැන්ටිමෙන් ලබා ගත් බිස්කට් හා බීම වර්ග සැලකිය යුතු තරමට එම සෙබලුන්ගේ සා පවස නිවා ගන්නට සමත් විය. තුවාලකරුවන්ටද හැකි පමණ ප්‍රතිකාර සැලසීමට එම ලද විරාම කාළ සීමාව තරමක අවස්ථාවක් සැලසීය. සතුරන් ප්‍රදේශය අත්හැර ගොස් ඇති බැව් ඉන් නොකියවුනද ඔවුනගෙන් එල්ල වූ ප්‍රතිරොධයේ සැලකිය යුතු අඩුවක් පෙනෙන්නට තිබිණ.

උදෑසන වන විට යාබදව පිහිටි එතරම් වැඩී නොතිබූ සියඹලා ගසක් ආසන්නයේ සිටි ගුණතිලක අවට විපරම් කළේය. එහිදී හරියටම දවසේ උදාව සනිටුහන් කරන්නා සේ එහි පැවති නිහඬ බව බිඳිමින් එක්වරම ප්‍රදේශය පුරා මෝටාර් බෝම්බ වැලක් පතිත වන්නට විය. ඒ මොහොතේ අන් කිසිදු ආවරණයක් නොවූ තැන බිම වැලි හාරා ඒ තුළ බැස ගන්නට ගුණතිලක අසාර්ථක වෑයමක් ගත්තේය. එහිදී කුඩා ගල් කැබලි, වැලි, දුවිලි විසුරුවමින් තැන තැන වැටෙන මෝටාර් බෝම්බ වලට අවට ගස් වල පොතු පවා ගැලවී යන අයුරු ඔහු දුටුවේය. තුවාල ලබන හා මියයන තම සහෝදර සගයින් තැන තැන වැටෙද්දී තවදුරටත් ජීවිතය රැකගන්නට වාසනාව ලැබීම පිළිබඳව හෙතෙම දෙවියන්ට ස්තුති කළේය. ත්‍රස්තවාදීන්ට එරෙහිව එකදු වෙඩි උණ්ඩයක් හෝ මුදාහැරීමට අවකාශයක් නොදීම එල්ලවූ එම මෝටාර් ප්‍රහාර හමුවේ තැන තැන සිරවී සිටි සෙබලුන්ට හුන්තැන් වලම රැඳී සිටිනවා හැරෙන්නට කළ හැකි අන් කිසිවක්ද නොවීය. එතෙක් සමූහයක් ලෙස උරෙනුර ගැටී සිටි සෙබළ පිරිසට දිගින් දිගටම පතිතවන එම මෝටාර් ප්‍රහාර හමුවේ තවදුරටත් එලෙස රැඳී නොසිට විසිරෙන්නට සිදුවූහ. අවසානයේ අවම වශයෙන් එහි ඉතිරිව සිටි සෙබලුන් දෙදෙනෙකු අතර දක්නට ලැබුණේ අඩි 10 ක පමණ පරතරයකි.

කුමන දිශාවකට වෙඩි තබන්නේද කුමන දිශාවකට පලා යා යුත්තේදැයි කිසිවකුට සිතාගත නොහැකිය. සීමිත ඉඩක් තුළ ආවරණ නොමැති භූමියේ රැඳී සිටි සෙබළ පිරිස අතරින් එක් මෝටාර් ප්‍රහාරයකින් අවම වශයෙන් තුන් හතර දෙනෙකු වත් මිය යන තරමට මරණය සුලබ විය. ත්‍රස්තවාදීන්ගේ මෝටාර් ප්‍රහාර නිසි ඉලක්ක බලා ප්‍රතිඵලදායී ලෙසම එල්ල කිරීමට ඔවුහු සමත්ව සිටියහ. ඒවා ආරක්ෂක වළල්ලට මෙන්ම යාබද යුධ අගල් තුළට පවා නිවැරදිවම පතිත විය. මේ අතර සිරුර පුරා ලේ වැගිරෙමින් ඔබමොබ දුවන සෙබලුන්ද, බිම වැතිරී මරණාසන්නව කෙඳිරි ගාන අයද, මියගියවුන්ගේ සිරුරුද, වෙඩි බෙහෙත් සුවඳැති දුහුවිලිද, මරලතෝනිද, සංග්‍රාමයේ බිහිසුණු බව මොනවට

කියාපෑවේය. මේ අතර ඉදිරියෙන් සහයක හට පිරිස් ඒ ආසන්නයට පැමිණ ඇති බවට තොරතුරු වාර්තාවන්නට විය. එසේම කඳවුරින් එපිට කිසියම් ප්‍රදේශයකට වෙඩි ප්‍රහාර එල්ල නොකරන ලෙසටද දැනුම් දෙන ලදී. එම ප්‍රදේශය හරහා ආධාරක හට පිරිස් කඳවුරට ඇතුල්වීමේ සූදානමක් පැවතීම ඊට හේතුවයි. පණිවිඩය කන් වැකුණු සැනින් හට පිරිස් වල උද්දාමය වැඩිවන්නට විය. ඔවුහු ලද උපදෙස් අකුරටම පිළිපැද්දේය.

("මරණය මැදින් මුලතිව් සිට" කෘතියෙනි)

ඉහත උපුටා ගැනීම හරහා මේ ලිපියේ ආරම්භය සනිටුහන් කරන්න හිතුවේ වර්තමානයට ගැළපෙන යමක් ඒ තුළින් ගතහැකි නිසයි. විශේෂයෙන්ම යුධ භූමියක තියෙන බිහිසුණුබව කඨෝරබව මේ ලිපිය කියවන පාඨකයින්ට දැනෙන්න හරින එක වැදගත්. සංග්‍රාම භූමියක හැටි සොබා අඳුනගන්න ඊට මුහුණදුන් අයෙකුට හැරෙන්න අන් කෙනෙකුට නොහැකියි. හමුදාවක කෙනෙකුට උනත් යුද්දෙ ගැන පොතක් කියවලා, යුධ චිත්‍රපටි බලලා ඒ ප්‍රායෝගික අත්දැකීම් ගන්න බැහැ. යුධ භූමියක තෝරා ගැනීම් මහ ගොඩක් නැහැ. ලැබෙන සීමිත අවස්ථාවන් තුළ ශිල්පයේ දක්ෂ බවත් වාසනා ගුණයත් අනුව කෙනෙකුගේ ජීවිතය රැකෙන එක තීරණය වෙනවා. අද අපේ රට හමුවේ එල්ල වී ඇති තර්ජනය දෙස බැලීමේදී අවසන් මොහොතෙත් අපිට සීමිත අවස්ථාවක් ලබාදී තිබෙන බව පේනවා. ඒ නිසා අපි ඒ අවස්ථාව හරියට පාවිච්චි නොකලොත් බොහෝ අනිසි ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්න වෙනවා. හැම කෙනෙකුටම අවදානම දැනගෙන වගකීමෙන් හැසිරීමේ වැදගත්ම යළි යළි මතක් කරන්නෙ ඒකයි.

කොරෝනා නිසා අද මිනිස්සු අතර දුරස්ථභාවය තියාගන්න උත්සහ කරනවා. රංචු ගැහෙන එක ජනාකීර්ණ තැන්වල ගැවසෙන එක අඩුවෙලා. සමස්තයක් ලෙස පොදු ප්‍රවාහන ක්‍රම භාවිතා කරන්න මැලි කමක් දක්වනවා. ඒ තරමට මේ කොරෝනා භීතිය ජනතාවට දැනිලා තියෙනවා. යුද්දේ කාලෙත් ඔවැනිම භීතියක් තිබුණා. ඒ තමයි ත්‍රස්තවාදීගේ බෝම්බ භීතිය, කාලබෝම්බ, පීඩන බෝම්බ, මරාගෙන මැරෙන ප්‍රහාර, අතොරක් නැතිව පුපුරන යුගයක් තිබුණා. අම්මා බස් එකේ ගියොත් තාත්තා ගියේ දුම්රියේ. බෝම්බයක් පිපිරුණොත් දරුවෝ බලාගන්න එක්කෙනෙක් හරි ඉතිරි වෙන්න ඕනනෙ කියන අදහසින් උදේ ගෙදරින් ගිය කෙනා හවස නැවත එනකල් විශ්වාසයක් තිබුණේ නැහැ. එතරම් අභාග්‍ය සම්පන්න අවිනිශ්චිත යුගයක් අපි පසුකලා. එය මෙරට ජනතාව අත්වින්දේ දවසක් දෙකක් මාසයක් අවුරුද්දක් නෙවෙයි. දශක තුනකට ආසන්න කාලයක්. ඒ සා දිගු කලක් අපේක්ෂා භංගත්වයට පත්වුණු මෙරට ජනතාවට ආයිත් නිදහසේ හුස්ම ගන්න හිතපුරා හිනාවෙන්න අවස්ථාව උදාවුණේ අහඹුවකින් නෙවෙයි. ඒ වෙනුවෙන් රණවිරුවෝ ජීවිත වලින් ගෙවූ වන්දිය කොරම්ද යන්න හරියටම දන්නේ මේ මහපොළොව විතරයි.


මේ වසංගතයෙන් රටක් හැටියට ගැළවෙන්න නම් හැමෝම විනය ගරුක වෙන්න ඕනේ. තේරෙන බාසාවෙන් කියන සරල උපදෙස් පිළිපදින්න ඕනේ. අපේ වගේ රටක විනය හදන එක ලේසි නැහැ කියලා වැඩි දෙනෙක් කියනවා. බටහිර රටවල පවතින විනය පිළිබඳ ඒ අය උදම් අනනවා. ඒ කියමන් බැහැර කරන්න බැරි වුනත් අපි රටක් හැටියට එක්වෙලා එහෙම විනයානුකූලව කටයුතු කරපු යුගයක් තිබුණා. ඒ තමයි මේ රට ත්‍රස්තවාදයෙන් ගළවා ගැනීමේ සටනේදි අපි ක්‍රියා කළ ආකාරය.

යුද්දේ බරපතල විදියට තිබුණු මුල් කාලවල භූමියේ බොහෝ තැන්වලදී අපි පරාජයට පත් වුණු අවස්ථා තිබුණා. කඳවුරු පිටින් විනාශ වුණා. එතෙක් රැකගෙන හිටපු ප්‍රදේශ අත්හැරලා කිලෝමීටර් ගණන් පසුබහින්න සිද්ධ වුණා. දහස් ගණනින් රණවිරුවන්ගේ ජීවිත අහිමිවුණ අවස්ථා තිබුණා. ඇතැම් කාලවල රණවිරුවෙක් නොමැරුණු දවසක් නැතිගානට පත්වුණා. තනි තනි සිද්ධි වලින් දිනපතා සෙබලු දෙතුන් දෙනෙක්වත් මැරෙන එක සාමාන්‍ය දෙයක් වෙලා තිබුණා. ඊට සාපේක්ෂව සතුරන්ගේ හානි අවම වුනා. ඒ අතරෙදී ඉහත තත්වය වෙනස් කරන්න පැවති රජයන් විවිධ සැලසුම් දියත් කලා. සාම සාකච්ඡා, සටන් විරාම වගේ දේවලුත් ඒ අතර ක්‍රියාත්මක කෙරුණා. නමුත් බල අරගල, කඹ ඇදීම්, පාවාදීම් වගේම පැවති තත්වයන් නිසිලෙස තක්සේරු නොකිරීම වැනි කරුණු නිසා එම සියලු උත්සාහයන් ජයග්‍රාහී දිශාවටම හරවන්න හැකිවුනේ නැහැ. (ඒ වුනත් ඒ අතරෙත් යම් යම් සාධනීය පැති තිබුණු බවත් පිළිගන්න වෙනවා. උදාහරණ ලෙස සාමසාකච්ඡා වැනි කටයුතු හරහා ***LTTE*** සංවිධානයේ බෙදීම් ඇතිවීම මෙන්ම එකළ සිදුකළ ඇතැම් ක්‍රියාන්විතවල ප්‍රතිඵල අවසන් සටනේ ජයග්‍රහණය දක්වාම හේතුපාදක උන බවත් කියන්න ඕනෙ.)

කොහොම වුනත් අවසන් සටන අවසානය වෙද්දී මුලු රටක්ම එකපෙළට හිටියා. රජකාලෙ තිබුණු ඇත්, අස් රිය, පාබල වගේ යුද නාවික ගුවන් පොලිස් හැමෝම එකට සටන් වැදුණා. රටපුරා රණවිරුවො දිරිගන්වන බැනර්, කටවුට්, පොස්ටර් අස්සක් මුල්ලක් නැර ප්‍රදර්ශනය වෙන්න පටන් ගත්තා. එතෙක් අහිමිවෙලා තිබුණු භූමිය පියවරෙන් පියවර නිදහස් වෙන අපුරුව බලන්න මිනිස්සු රූපවාහිනිය වටා පොදි කන්න වුනා. රටපුරාම රණවිරුවන් වෙනුවෙන් ගැලුම් ගණනින් ලේ දන්දෙන්න පටන් ගත්තා. සාමාන්‍ය ජනතාව ආරක්ෂක අරමුදලට මිලියන ගණනින් මුදල් පරිත්‍යාග කරනකොට, සටන් බිමේ හිටපු විරුවන්ට ආහාරපාන ඇතුලු විවිධ දේ ලබාදෙන්නත් බොහෝ දෙනෙක් ඉදිරිපත් වුනා.

පන්සල්, පල්ලි, කෝවිල්වල ආශිර්වාද පූජා සෙත් පැතීම් එක දිගට සිදුවෙද්දී වසර 30 ක් ත්‍රස්තවාදයෙන් බැට කෑ සියලු ශ්‍රී ලාංකේය ජාතියම එක පෙළට හිටගත්ත. හැබැයි ඒ අතරත් කකුලෙන් ඇදපු, කකුල් මාට්ටු දාපු, වෙට්ටු දාපු අයත් නොහිටියාම නොවෙයි. කොහොම වුනත් රටේ බහුතර ජනතාවගේ අපේක්ෂා බලවත් වුණු නිසාත් සදාකාලිකවම වැරැද්දකට අපරාධයකට සොබාදහමේ නීතිය අනුව ඉඩක් නැති නිසාත් රටේ ජයග්‍රහනය ස්ථිර වුනා.

එවැනි අත්දැකීම් සහිත ජාතියක් හැටියට මේ වෙලාවෙත් හැමෝම එකමුතුව විනය පෙන්වන්න ඕන. කොරෝනාවලට එරෙහි සටනේ අපි වඩාත් පරිස්සම් වෙන්න ඕන කාලය ඇවිත්. මෙතෙක් කළ සියලු සැලසුම්, කැපකිරීම්වල ප්‍රතිඵල ලැබෙන කාලය මේක. ඒ නිසා මේ තීරණාත්මක මොහොතෙ "අවදානම දැනගෙන අවබෝධයෙන් කටයුතු කරන්න" අපි හැමෝම සිහිතබා ගනිමු.



මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## විශ්‍රාමික පුරවැසියන් හට යුද්ධ හමුදාවෙන් සහනයක්...





සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ කොරෝනා වෛරසය හේතුවෙන් රටේ පනවා ඇති හදිසි තත්වය මත යාපනය දිස්ත්‍රික්කයේ පීඩා විඳින විශ්‍රාමික පුරවැසියන් හට තම විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා යුද්ධ හමුදාවේ සහාය හිමිවිය. යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ උපදෙස් පරිදි ඉකුත් අප්‍රේල් මස 02, 03 සහ 06 යන දිනයන් හිදී යුද්ධ හමුදා බස්රථ මගින් ඔවුනට ප්‍රවාහන පහසුකම් ලබාදී එහි සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.

## තවත් මහඟු සත්කාරයක්...





යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ අදහසකට අනුව කොරෝනා වෛරසයෙන් රෝගාතුරව සිටින ශ්‍රී ලංකා ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන් යාපනය ශික්ෂණ රෝහලේ ලේ බැංකුව වෙත රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 4 වන ශ්‍රී ලංකා වෛද්‍ය බළකායේ සංවිධාන ශක්තියෙන් ඉකුත් මාර්තු 24 දින එම ඒකක මූලස්ථානයේදී පැවැත්විණ. යාපනය බළ ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් ද එම සත්කාරයට දායක වූහ.

## මානසික සුවයට හරවත් දෙසුමක්...





දැනට රට තුළ පවතින කොරෝනා වෛරස තත්වය හේතුවෙන් නිරෝධායන මධ්‍යස්ථානයන් හි සේවය කරමින් සිටින කාර්ය මණ්ඩලයට මෙන්ම නිරෝධායනයට ලක්ව මේ වන විට ප්‍රතිකාර ලබමින් සිටින අයවලුන්ගේ කායික මානසික තත්වය පවත්වාගෙන යාම මුල්කොටගෙන දියතලාව මුලික රෝහල වෙතින් ඉකුත් අප්‍රේල් 18 දින දේශනයක් පවත්වන ලදී.

එම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් සහ දියතලාව පොලිස් ස්ථානාධිපති, රෝහල් කාර්ය මණ්ඩලය ඇතුලු යුද්ධ හමුදා සාමාජිකයින් රැසක් සහභාගි වූහ.

# රණවිරු ප්‍රජා සත්කාරයක්...





කොරෝනා වෛරසය ව්‍යාප්තවීම අවම කිරීම සඳහා ඇඳිරිනීතිය පනවා ඇති අවස්ථාවන් හිදී ප්‍රදේශයේ ජනතාව වෙත ඇතිවන අවහිරතා අවම කිරීම පිණිස 62 සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඑම්ඩී ජයසිංහ ගේ උපදෙස් පරිදි 621 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා වියළි ආහාර බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 12 දින සිදුකෙරිණ. මේ යටතේ පරාක්‍රමපුර, පදවිය, බිසෝකොටුව වැව, ග්‍රෙවල් කන්ද, වෙහෙරතැන්න යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බළ ප්‍රදේශයන්හි ගම්මාන ආවරණය වන පරිදි වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදෙන ලදී. මෙම වැඩසටහන 17 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සහ හල්මිල්ල වැව වනරතන හිමියන්ගේ සම්බන්ධීකරණයෙන් සිදුකරන ලදී.

# විශ්‍රාමිකයන්ට උපකාරයක්...





ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් පැතිර යන නව කොරෝනා වෛරසය හේතුවෙන් රටේ පනවා ඇති හදිසි තත්වය මත පීඩාවට පත්ව සිටි විශ්‍රාමික පුරවැසියන්ට සිය විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා සහයවීමට යුද්ධ හමුදා හට පිරිස් එක්වූහ. ඒ අනුව වන්නි ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් මත අනුරාධපුර, වව්නියාව, මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි එම ප්‍රදේශවල සිටින විශ්‍රාමික අයවලුන් බැංකු වෙත කැඳවාගෙන යාමටත් නැවත ඔවුන් සිය නිවෙස්කරා යැවීමටත් එම හට පිරිස් ක්‍රියාකරන ලදී.

# ලේ පරිත්‍යාග කිරීමක්...

මේ දිනවල පවතින කොරෝනා වෛරස් තත්වය හමුවේ රෝගීන් සඳහා හදිසි ප්‍රතිකාර ලබාදීමට ඇවැසි ලේ පරිත්‍යාග කරන ලෙස වව්නියාව මූලික රෝහලේ ලේ බැංකුවේ රුධිර පාරවිලන චිකිත්සක වෛද්‍යවරයා කර ඇති ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපතිගේ උපදෙස් මත ඉකුත් අප්‍රේල් 12 දින ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදී.





# පීඩාවට පත් ජනතාවට යුද්ධ හමුදාවෙන් අත්වැලක්...





14 සේනාංකය යටතේ ඇති 141, 142, 143 සහ 144 යන බලසේනාවන්හි භට පිරිස් යුද්ධ හමුදාධිපති තුමන්ගේ උපදෙස් මත කොළඹ, ගම්පහ, කළුතර, පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි පීඩාවට පත් ජනතාව අතර නැවුම් එළවළු ටොන් 168 ක් බෙදාහැරීමේ සමාජ සත්කාරයකට දායක වූහ. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධානතම පරිත්‍යාගශීලියෙකු වන පියසේන ගමගේ මහතා විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදී තිබුණි. එහිදී එක් බෑගයකට කිලෝග්‍රෑම් 05 ත් 06 ත් අතර ප්‍රමාණය බැගින් වන සේ එළවළු පාර්සල් 15000 කට අධික ප්‍රමාණයක් ඇසුරුම් කර තිබීම විශේෂත්වයකි. තවද රුපියල් 5000.00 බැගින් රජයෙන් ලබාදෙන දීමනාවට හිමිකම් ඇති පවුල් මෙන්ම ඇඳිරි නීතිය හේතුවෙන් දුෂ්කරතාවයට පත්වූ පවුල් වෙතද මෙම එළවළු පාර්සල් බෙදාහැරීමට කටයුතු යෙදිණ.



## රණවිරුවන්ගෙන් ලේ බිඳක්...

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපතිගේ උපදෙස් හා මගපෙන්වීම මත එම මූලස්ථානය වෙතින් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහනක් පනාගොඩ යුද්ධ හමුදා බෝධිරාජාරාම විහාරස්ථානයේදී ඉකුත් අප්‍රේල් 08 දින පැවැත්විණ. එහිදී ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සහ යුද්ධ හමුදා ජනපදය තුළ ස්ථාපිත ආයතනයන්හි රාජකාරී නියුතු 50 කින් යුත් භට පිරිසක් ඊට සහභාගි වූහ.



## රණවිරුවන්ගෙන් තවත් සත්කාරයක්...

යාපනය ශික්ෂණ රෝහල වෙත ගිලන්රථ මගින් රැගෙන එන රෝගීන් බැස්සවීමේදී සහ රෝහල වෙතින් වෙනත් ස්ථාන වෙත ප්‍රවාහනය කළ යුතු රෝගීන් ගිලන්රථ වෙත යොමුකරවීමේදී ඒවා නැවැත්වීම සඳහා ආරක්ෂිත ස්ථානයක් මෙතෙක් ඉදිකර නොතිබිණ. ඒ පිළිබඳ යාපනය ශික්ෂණ රෝහල් කාර්ය මණ්ඩලය විසින් යාපනය ආරක්ෂක සේනා ආඥාපතිගෙන් කළ ඉල්ලීමකට අනුව ගිලන්රථ නැවතුම් ස්ථානයේ වැසි සහ අව් රශ්මියෙන් ආරක්ෂා වීම සඳහා ආවරණ පියස්සක් ඉදිකිරීමට කටයුතු කෙරිණ. එහි ඉදිකිරීම් කටයුතු 5 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් සිදුකරනු ලැබූ අතර, ඉකුත් අප්‍රේල් 17 දින එය ජනතා අයිතියට පත්කරන ලදී.



## විරු දෑතින් දිරියක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මෙන්ම ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයකට අනුව කොවිඩ් 19 වෛරසය හේතුවෙන් අපහසුතාවයන්ට පත්වූ සිය රෙජිමේන්තු මධ්‍යස්ථානයට අනුයුක්තව රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහතුන් වෙනුවෙන් වියළි සලාක පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 17 දින රොක්හවුස් කඳවුරු පරිශ්‍රයේදී සිදුකරන ලදී.

## මිනිසත්කමට අරුතක්...





2019.04.21 වන පාස්කු ඉරිදා දිවයිනේ කතෝලික දේවස්ථාන සහ ප්‍රසිද්ධ හෝටල් කිහිපයක් ඉලක්ක කර එල්ල කරන ලද ප්‍රහාරයෙන් මියගිය අයවලුන් සිහිපත් කර ඔවුන්ට පිං පැමිණවීමද, තුවාල ලැබූ සහ ආබාධිත තත්වයට පත්වූ අයවලුන් හට ඉක්මන් සුවය පතා සෙත් පැතීමද අරමුණු කොට ගෙන ඉකුත් අප්‍රේල් 21 දින 64 සේනාංක මූලස්ථානයේදී ආගමික වැඩසටහනක් සිදුකෙරිණි. එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඒඑම්ආර්බීටී හත්නාගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රමුඛ සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් ඊට සහභාගි වූහ.

## පරිත්‍යාග කිරීමක්...

මේ වන විට ලොව තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්තවන කොරෝනා වෛරසය පැතිරීම අවම කිරීම සඳහා රට තුළ පනවා ඇති ඇඳිරි නීති තත්වය හේතුවෙන් ඇල්කඩුව ගම්මානයේ දෛනික වැටුප් ලබන කම්කරුවන් සහ දිළිඳු ප්‍රජාවගේ ආදායම් මාර්ග මුලුමනින්ම අවහිර වීමෙන් මූලික අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට අපහසු වී ඇත. ඒ කරුණු කෙරෙහි අවධානය යොමුකළ විශේෂ බලකා රෙජිමේන්තුව විසින් ඇල්කඩුව ගම්මානයේ එවැනි තෝරාගත් කම්කරු පවුල් 23 ක සාමාජිකයින් 78 දෙනෙකු සඳහා සතියක කාලයක් පරිභරණයට ගත හැකි වියළි සලාක සහ එළවලු වර්ග පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් විශේෂ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී එහි මධ්‍යස්ථාන සේනාවිධායක ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී.





## රුධිරය පරිත්‍යාග කිරීමක්...





පවතින කොවිඩ් 19 වෛරසය හේතුවෙන් දිවයිනේ රෝහල් බොහොමයක ක්‍රියාත්මක ලේ බැංකු මගින් අත්‍යවශ්‍ය රෝගීන්ට රුධිරය ලබාදීමේදී ගැටලුකාරී තත්වයකට මුහුණදී ඇත. ඒ අනුව හොරණ මූලික රෝහලේ ලේ බැංකුවේ වෛද්‍ය කාර්ය මණ්ඩලය මගින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව අත්‍යවශ්‍ය රෝගීන් වෙනුවෙන් රුධිරය පරිත්‍යාග කිරීමේ අවස්ථාවකට ලයා ලෙෂර් කුකුලේගඟ ප්‍රධාන විධායක නිලධාරී බ්‍රිගේඩියර් එම්ජ්ආර් ගුණසේකර ආර්එස්පී ඇතුලු කාර්ය මණ්ඩලය ඉකුත් මාර්තු 27 එම ආයතන පරිශ්‍රයේදී දායක වූහ.

---

## "කොරෝනා" ගැන දෙසුමක්...

ආරක්ෂක සේනා මූලස්ථානය මුලතිව් ආඥාපතිගේ උපදෙස් පරිදි මුලතිව් බළ ප්‍රදේශය යටතේ ඇති 59, 64 සහ 68 සේමුහි රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා කොවිඩ් 19 වෛරසය පිළිබඳ දැනුවත් කිරීමක් ඉකුත් මාර්තු 27 දින ආරක්ෂක සේනා මූලස්ථාන මුලතිව් දේශන ශාලාවේදී පවත්වන ලදී.



එම දේශනය යුද්ධ හමුදා මූලික රෝහල මුලතිව්හි රාජකාරී කරනු ලබන වෛද්‍ය කපිතන් නිසල රත්නායක සහ බනි 1 ඩීජ් ප්‍රේමචන්ද්‍ර ඇතුලු කාර්ය මණ්ඩලය විසින් සිදුකළ අතර, එම අවස්ථාවට නිලධාරී සහ සෙසුනිලයින් 70 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වූහ.

---

## තවත් පූජා සත්කාරයක්...





කොරෝනා වෛරසය නිසා දිවයින පුරා ඇඳිරිනීතිය පැනවීම හේතුවෙන් දැඩි දුෂ්කරතාවකට පත්ව සිටින කච්චුවරි, පුදියකොලානි, පනික්කකුලම් සහ ඕළුමඩු ප්‍රදේශයන්හි අඩු ආදායම්ලාභී පවුල් සඳහා පිසින ලද ආහාර සහ පානීය ජලය බෙදාදීමේ වැඩසටහනක් 571 බළසේනාවෙහි භට පිරිස් විසින් ඉකුත් මාර්තු 26 දින සිදුකරන ලදී. ඊට සමගාමීව කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා සිවිල් වැසියන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද, 571 සහ 572 බළසේනා මූලස්ථාන මගින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපතිගේ සහ 57 සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත ක්‍රියාත්මක කෙරිණ.

## ලේ බිඳක් දන්දෙමින්...





12 සේනාංකය සහ හම්බන්තොට රෝහලේ ලේ බැංකුව එක්ව සිදුකරනු ලබන ලේ දන්දීමේ කඳවුරේ ප්‍රථම අදියර ඉකුත් අප්‍රේල් 09 දින 9 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු පරිශ්‍රයේදී පවත්වන ලදී. එහි දෙවන සහ තෙවන අදියරයන් 2020 අප්‍රෙල් 16 දින සහ 21 යන දිනයන්හිදී පිළිවෙලින් 23 ගජබා රෙජිමේන්තුව සහ 3 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව හිදී පැවැත්විණ. මෙම ලේ පරිත්‍යාගය පවතින දුෂ්කර අවස්ථාවේ එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට මහත් වූ සහනයක් වනු නොඅනුමානය.

## රුක් රෝපණයට මුල්වෙයි...





උදා වූ 2020 සිංහල අලුත් අවුරුද්ද නිමිති කොටගෙන ඉකුත් අප්‍රේල් 19 දින යෙදුණු සුබ නැකතට අනුව 53 සේනාංකයේ සියලුම ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් නා පැළ රෝපණය කිරීමේ මාහැගි කටයුත්තක් සේනාංක මූලස්ථානය ස්ථාපිත හබරණදී සිදුකෙරිණ.

## විරු හිසට සෙවණක්...

66 සේනාංක මූලස්ථානයේ අභිනවයෙන් ඉදිකරන ලද කොමිෂන් නොලත් නිලධාරීන්ගේ සමාජ ශාලාව සහ සෙසුනිල භෝජනාගාරය කොවිඩ් 19 වෛරසය හේතුවෙන් දැඩි සෞඛ්‍ය ආරක්‍ෂක ක්‍රමවේදයන් අනුගමනය කරමින් පැවති සරල උත්සවයකදී පසුගියදා විවෘත කෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 66 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ඩී විජේසුන්දර ආර්එස්පී සහභාගි විය.





## දිරිය මිනිසුන්ට අතහිත...





කිලිනොච්චි බළප්‍රදේශයේ පිහිටි තේවන්පිඩ්ඩි සහ වෙල්ලන්කුලම් ප්‍රදේශවාසී සමෘද්ධිලාභීන් 258 දෙනෙකු සඳහා රජය විසින් ලබාදුන් වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 01 දින සිදුකෙරිණ. ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරීන්ගේ සම්බන්ධීකරණය මත 19 ශ්‍රී ලංකා පාබල හමුදාවේ භට පිරිස් විසින් සිදුකරන ලදී. මෙම වැඩසටහන කිලිනොච්චි ආරක්‍ෂක සේනා ආඥාපතිගේ උපදෙස් මත 65 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ මෙහෙයවීමෙන් සංවිධානය කරන ලදී.

## යුධෝපකරණ සේවා අධ්‍යක්ෂගේ සංචාරයක්...





යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සීයූ මාරසිංහ ආර්එස්පී යූඑස්පී පසුගියදා යුද්ධ හමුදා රෙදිපිළි ගබඩා පරිශ්‍රයේදී වාර්ෂික යුධෝපකරණ කාර්මික පරීක්‍ෂණය සිදුකරන ලදී. එහිදී යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාවේ වත්මන් තත්වය, ගබඩා කලමණාකරණය හා එහි ආරක්ෂිත විධික්‍රම මෙන්ම කාර්මික ක්‍රියාවලිය පිළිබඳ ඔහුගේ පූර්ණ අවධානයට ලක්විය. සංචාරය අවසානයේදී යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ විසින් එහි සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය.

## විරු දෑතින් සරණක්...

කිලිනොච්චිය ආරක්‍ෂක සේනා මූලස්ථාන ආඥාපති ගේ උපදෙස් මත 572 බළසේනාධිපතිගේ අධීක්‍ෂණය යටතේ විශ්වමඩු ප්‍රදේශයේ ජනතාව වෙත කෙටි ආහාර වේලක් සහ පානීය ජලය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු 26 දින පවත්වන ලදී. දැනට ව්‍යාප්ත වෙමින් පවතින කොරෝනා වෛරසය හේතුවෙන් පීඩාවට පත් ජනයා වෙත සහන සැලසීම එහි අරමුණයි.





## කොරෝනා මැඩලීමට පරිත්‍යාගයක්...





දකුණු කොළඹ ශික්‍ෂණ රෝහලේ බලධාරීන් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපතිගෙන් කළ ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ හට පිරිස් විසින් නවීකරණය කරන ලද විශේෂ විෂබීජ නාශක කුටියක් සහ පුද්ගලික ආරක්‍ෂක උපකරණ කට්ටල 30 ක් ඉකුත් අප්‍රේල් 07 දින එම රෝහල වෙත භාරදෙනු ලැබීය. තවද එවැනිම තවත් ආරක්‍ෂක උපකරණ තොගයක් ද සොයිසා මාතෘ රෝහල වෙතද පරිත්‍යාග කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මෙන්ම ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම භාණ්ඩ තොගය භාරදෙනු ලැබීය.

---

## කොරෝනා මැඩලීමට සහාය....





පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපාධි අපේක්‍ෂකයෙකු වන කේෂර වීරසිංහ මහතා විසින් සිදුකළ පර්යේෂණ ගණනාවකින් පසු ඔහුගේ නව නිර්මාණයක් ලෙස නවීකරණය කරන ලද මුඛ ආවරණ තොගයක් නිෂ්පාදනය කර තිබේ.කොවිඩ් 19 වෛරස් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී වෛද්‍යවරුන්ට සහ වෛද්‍ය කාර්ය මණ්ඩලයට ආරක්‍ෂාකාරීව ඒවා භාවිතා කළ හැකිවීම විශේෂත්වයකි.

ඔහු විසින් නිර්මාණය කරන ලද එම මුඛ ආවරණ 200 ක තොගයක් ඉකුත් අප්‍රේල් 07 දින යුද්ධ හමුදා මූලස්ථානය වෙත භාරදෙනු ලැබීය. 11 සේනාංකයේ සේනාංකාධිපතිගේ සම්බන්ධීකරණයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය බීඩී ගුණවර්ධන මහතා සමගින් කේෂර වීරසිංහ මහතා විසින් යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රයේදී යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්‍ෂ මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී වෙත ප්‍රථමයෙන් අදාළ මුඛ ආවරණ භාරදෙනු ලැබූහ.

---

## නව ගොඩනැගිලි සෙසුනිළ අයිතියට පැවරේ...





ගල්කුලම ප්‍රදේශයේ පිහිටි 62 සේනාංක මූලස්ථානයේ සියලු නිලයින් සඳහා අභිනවයෙන් ඉදිකරන ලද දන්ත වෛද්‍ය ඒකකය සහ ප්‍රතිසංස්කරණය කරන ලද කායවර්ධන මධ්‍යස්ථානය ඉකුත් අප්‍රේල් 14 දින එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ ගේ සුරතින් නිරාවරණය කෙරිණ.



# රෙජිමේන්තු ඉතිහාසය





බළකාධිපති
මේජර් ජෙනරාල් එම්එච්ඩී සිරිනාග

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය...

1948 වර්ෂයේදී ශ්‍රී ලංකාවට අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලැබීමෙන් පසු 1949 ඔක්තෝබර් 10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ආරම්භ කරන ලදී. ගාලු මුවදොර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානය තුළ පවත්වාගෙන ගිය රාජකීය වියාඉ වැඩපල 1949 වර්ෂයේ දෙසැම්බර් 12 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පවරනු ලැබීය. එහි ප්‍රථම උපදේශක හා භාරකරු ලෙස රාජකීය වියාඉ බළකායේ කපිතාන් රෝයි ඩේවිස් පත්විය. එම වැඩපලෙහි යාන්ත්‍රික ප්‍රවාහන රථවල මෙන්ම යුද්ධායුධවල සුළු අළුත්වැඩියාවන් පමණක් සිදුකරන ලදී.

1950 සැප්තැම්බර් මස 01 වන දින ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළ කොම්පඤ්ඤවීදිය අසල කිව් පාරේ අංක 40 දරණ ස්ථානය වෙත ගෙන එනු ලැබීය. 1950 දෙසැම්බර් මස 10 වන දින මෙම වැඩපලෙහි ප්‍රථම නිළධාරී අණදෙන ලෙස කපිතාන් එන් වී මැතිව්ස් පත් කළ අතර යුහ වැඩපලෙහි නිළධාරී අණදෙන ලෙස 2/ලුතිනන් ආර් ඒ ජේ රත්නම් පත් කරන ලදී. 1951 ඔක්තෝබර් මස 01 වන දින කපිතාන් එන් වී මැතිව්ස් වියාඉ ඒකකයේ ස්ථාන භාර නිළධාරී ලෙස පත් කරන ලද අතර, වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය එම වැඩපල පරිශ්‍රයෙහි ස්ථාපනය කරන ලදී.

1972 වර්ෂයේදී ලංකා වියාඉ බළකාය ශ්‍රී ලංකා වියාඉ බළකාය ලෙස නම් කරන ලද අතර, යුද්ධ හමුදාවේ අවශ්‍යතාව මත ශ්‍රිලවියාඉ බළකාය වෙත නිලධාරීන් හා සෙනින් බඳවා ගන්නා ලදී. එම ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බළකාය කාතු අවි සහ සන්නද්ධ රථ අළුත්වැඩියාව සඳහා විශේෂිත බළඇණි දෙකක් ඇතුළුව බළඇණි නවයකින්, මූලික වැඩපල තුනකින්, කර්මාන්ත වැඩපලකින් සහ වියාඉ පුහුණු පාසලකින්ද සමන්විත වේ.

1980 කාලවකවානුව වන විට ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශ කේන්ද්‍ර කරමින් ජනවාර්ගික අර්බුදයක් එල්ටීටීඊ සංවිධානය විසින් නිර්මාණය කරන ලද අතර, එය මර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් ක්‍රියා කරන ලදී. එම බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව කළ සටනේදී මෙම රෙජිමේන්තුවට අයත් වීරෝදාර රණවිරුවන් අනෙකුත් රණවිරුවන් සමග උරෙන් උර ගැටී කළ ඒ වීර ක්‍රියාන්විත කටයුත්තේදී දිනූ දේශය වෙනුවෙන් මන්නාරම කන්තලේ ත්‍රිකුණාමලය තෝපූර් යාපනය මුලතිව් පරන්තන් වව්නියාව වැලිඔය මඩකලපුව අලිමංකඩ යන ක්‍රියාන්විත ප්‍රදේශයන්හිදි අප බළකායට අයත් නිළධාරීන් 04 ක් සහ සෙසු නිළයින් 62 ක් මව්බිම වෙනුවෙන් සිය ජීවිත පූජා කළහ. ඔවුන් අප හදවත්හි සදා මතකයේ තබා ගැනීම වෙනුවෙන් 1999 වර්ෂයේදී ශ්‍රිලවියාඉ බළකායේ 50 වන සංවත්සරය මූලික කරගෙන ඓතිහාසික ගන්නොරුව ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් රණවිරු ස්මාරකයක් වියාඉ පාසල් භූමියේ ස්ථාපනය කෙරිණි.

ත්‍රස්තවාදීන්ට එරෙහි සටනේදී පාබල ඒකක වෙත සටන් පහසුව සඳහා ශ්‍රිලවියාඉ බළකාය වෙතින් යුධමය අවශ්‍යතා සඳහා සිදු කරන ලද නිර්මාණ අතර බිම් බෝම්බ ආරක්ෂක සපත්තු නිර්මාණය කිරීම, ට්‍රැක්ටරයක ආර්සිඑල් අවි සවි කිරීම, ක්‍රියාන්විත ප්‍රදේශ සඳහා ජංගම වැඩපල රථ නිර්මාණය කිරීම, ක්ෂණිකව අතින් දිගහැරිය හැකිවන පරිදි නිපදවන ලද ඉනිමගක් නිර්මාණය කිරීම හා ක්ලේමෝ බෝම්බ ප්‍රහාර වලින් වැළකීමට බස් රථ හා ට්‍රක් රථ නවීකරණය කිරීම විශේෂ නිර්මාණ වේ. මෙම නිර්මාණ තුළින් ක්‍රියාන්විත ප්‍රදේශ වල රාජකාරී කළ පාබල ඒකක වෙත ඉතා හොඳ සහයක් ලබා ගැනීමට හැකිවිය.

1984 වර්ෂයේදී මෙම බළකාය වෙතින් "යකා" ලෙස සන්නද්ධ රථයක් වැඩිදියුණු කරන ලද අතර, සන්නද්ධ රථ නිෂ්පාදන පෙරළිය පසුකාලීනව ස්ටැලියන් මාක් ***I, II*** රථ යුනිකෝන් මාක් ***I, II, III, IV, V*** යන රථ, යුනි බෆල් මාක් ***I, II*** රථ ද මෑත කාලයේදි ඇවලෝන් නමින් නවතම සන්නද්ධ රථයක් ද නිෂ්පාදනය තුළින් වියාඉ බළකායේ වෘත්තිය නිපුණත්වය ලොවටම විදහාපාන කරුණකි.

ඉදිරිපත් කිරීම
රෙජිමේන්තු මධ්‍යස්ථාන
ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රින ඉංජිනේරු බළකාය

VISION

# English

VISION SPECTRUM

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Could you please

යම්කිසි ක්‍රියාවක් සිදුකිරීමට "ඔබට පුලුවන්ද" යන අර්ථය හඟවමින් එය කිරීමට ඇති හැකියාව පිළිබඳව විමසීම සඳහා මෙම වාක්‍යය රටාව භාවිතා වේ.

***Fomular*** **-** සූත්‍රය

**Could you please + Verb (Infinitive) + Object + Rest?**
කුඩ් යූ ප්ලීස්+ වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
ඔබට පුලුවන්ද+ ක්‍රියා පදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. Could you please open the door?
   කුඩ් යූ ප්ලීස් ඕපන් ද ඩෝ?
   ඔබට පුලුවන්ද කරුණාකර දොර අරින්න?

2. Could you please sing a song?
   කුඩ් යූ ප්ලීස් සින්ග් අ සෝන්ග්?
   ඔබට පුලුවන්ද කරුණාකර සිංදුවක් කියන්න?

3. Could you please help me to pass the test?
   කුඩ් යූ ප්ලීස් හෙල්ප් මී ටූ පාස් ද ටෙස්ට්?
   ඔබට පුලුවන්ද කරුණාකරල මට විභාගය සමත් වෙන්න උදව් කරන්න?

4. Could you please give some water?
   කුඩ් යූ ප්ලීස් ගිව් සම් වෝටර්?
   ඔබට පුලුවන්ද කරුණාකර වතුර ටිකක් දෙන්න?

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී කාල අර්ථයෙන් එම වාක්‍යය භාවිතා වී ඇති බව වටහාගත හැක. මෙම වාක්‍ය රටාව භාවිතා කිරීමේදී.

***Ex*** / උදා :-

¦ Could you :- ඔබට පුලුවන්ද ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම ඛණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයෙහි භාවිතා වේ.

¦ **Verb : -** ක්‍රියා පදයේ වාක්‍යයේ භාවිතා කිරීමේදී ක්‍රියා මූල **infinitive** පදයක් ලෙස භාවිතා කළ යුතුය.

¦ **Objective :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒක වචන, බහු වචන භේදයකින් තොරව භාවිතා වේ.

¦ ***Rest :-*** ඉතිරි වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

Analysis of the sentence formation
වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.

Could you + Verb(infinitive) + Object + Rest.
කුඩ් යූ + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
ඔබට පුලුවන්ද + ක්‍රියා පදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

Could you open the door please?
කුඩ් යූ ඕපන් ද ඩෝ ප්ලීස්?
ඔබට පුලුවන්ද කරුණාකර දොර අරින්න?

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මග හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**කපිතාන් චමින්ද ලියනගේ**
**ශ්‍රීලයුසෙදුසේබ**
**සංඥා පුහුණු පාසල - බුවැලිකඩ**
**www.englishvision.lk**





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී**

2020 අප්‍රේල් මස 11 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා සංඥා බළකායේ බළකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් ඩීඑච්එන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී**

2020 පෙබරවාරි මස 25 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ලෙස

**මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**

2020 මාර්තු මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලෙස

**මේජර් ජෙනරාල් ඒජීඩීඑන් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 පෙබරවාරි මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



64 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් එච්ජීඑම්ආර්බීටී හත්නාගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 අප්‍රේල් මස 09 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



66 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ**

2020 අප්‍රේල් 22 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලෙස

**බ්‍රිගේඩියර් එස්පීකේජේ පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 අප්‍රේල් මස 17 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



පාබල පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 අප්‍රේල් මස 22 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



22 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ**

2020 අප්‍රේල් මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බ්‍රිගේඩියර් (ප්‍රමා) ලෙස

**බ්‍රිගේඩියර් ඩීජී හේවගේ ආර්එස්පී**

2020 අප්‍රේල් මස 08 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



66 සේනාංකයේ කර්නල් (ප්‍රමා) ලෙස

**කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 අප්‍රේල් මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) කර්නල් (ප්‍රමා) ලෙස

**ලුතිනන් කර්නල් බීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 අප්‍රේල් මස 17 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු

## බිරිඳගේ ආදරය...

**නිමල්** - වයිෆ් උඹට මාර ආදරෙයි නේද බන්?

**සුගත්** - ඇයි බං එහෙම ඇහුවෙ...?

**නිමල්** - උඹ ගොඩක් ආදරේ හින්දනෙ ෆෝන් එකේ වයිෆ්ගෙ නම වෙනුවට ***Bunny*** කියල දාල තියෙන්නෙ

**සුගත්** - පිස්සුද බන්... ඒකි මට කෝල් ගත්තොත් බනින එකමයි වැඩේ... ඒකයි ***Bunny*** කියල දැම්මෙ...



## මල්ලි බබා...

**පුතා** - අම්මේ... මට මල්ලි බබෙක්වත් ගෙනත් දෙන්නකො සෙල්ලං කරන්ඩ... කවුරුත් නෑනෙ අප්ප තනියට...

**අම්මා** - තාත්ත රටනෙ පුතේ ඉන්නෙ... තාත්ත ආපුවහම මම අනිවාර්යෙන් ඔයාට මල්ලි බබෙක් ගෙනත් දෙනව...

**පුතා** - අපි තාත්තව පුදුම කරවන්නත් එක්ක තාත්ත එන්න කලින් මල්ලි බබෙක් ගේමුකෝ අම්මේ... එතකොට තාත්තට සතුටු හිතෙයි...



## අහවල් සායනය...

**ඩොක්ටර්** - නර්ස්... ඊළඟ කෙනාව ඇතුළට එවන්න...

**විමල** - ඩොක්ට... මම මහත්තයටත් ඇතුළට එන්න කියන්නද..?

**ඩොක්ටර්** - මිස්... මං ගැන එහෙම කැත විදියට හිතන්න එපා... මං එහෙම ජරා ඩොක්ට කෙනෙක් නෙමෙයි...

**විමල** - ඒක මම දන්නව ඩොක්ට... ඒත් අර නර්ස් එළියෙ තනියමනෙ ඉන්නෙ... මට අපේ මහත්තය ෂුවර් නැහැ...

## යාලුවො හඳුනා ගැනීම...

**රන්සිත** - සුදූ... එන්නකො ඔයාට කියන්ඩ වැදගත් දෙයක් තියෙනව...

**ලංකානි** - කනමදය වගේ බීගෙන ඇවිත් බොරුවක් කියන්ඩනෙ හදන්නෙ ඔය...? මං විශ්වාස කරන්නෑ ඕව..

**රන්සිත** - නෑ...නෑ... බොරුවක් නෙමෙයි... මං අද වැඩ ඇරිල එනකොට ඔයාගෙ හොඳම යාලුවො දෙන්නෙක් හම්බුණානෙ...

**ලංකානි** - අනේ ඒ කව්ද...? ඉස්කෝලෙ යාලුවො දෙන්නෙක්ද?

**රන්සිත** - එහෙනම් මට කිව්වෙ නෑ... ගෑණු කෙනෙකුයි පිරිමි කෙනෙකුයි හිටියෙ... හැබැයි මට මෙහෙම කිව්ව... මං බැඳල ඉන්නෙ එයාල දෙන්නගෙ දුව කිව්ව... එච්චරයි මට මතක...

## හොරකම...

**හොරා** - හෙලෝ... අපි තමුසෙගෙ වයිෆ්ව ඉස්සුව...වයිෆ් ඕනිනම් රුපියල් ලක්ෂ 10 හෙට වෙනකොට ලෑස්ති කරල තියනවා... එහෙම නැත්තන් වයිෆ්ව පෙට්‍රල් දාල ගිනි තියනව හරිද...

**සුපුන්** - හෙට වෙනකන් ඉන්ඩ ඕනි නෑ... මම මේ දැන්ම පැට්‍රල් ලීටර් 10 ක් අරගෙන එන්නම්...මට හරියට කියන්ඩකො එන්ඩ ඕන තැන පිළිවෙලින්....



# ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති උතුරේ සංචාරයක...







යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, ආඥාපති යුද්ධ හමුදා පුහුණු අණසක මෙන්ම ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා අර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පසුගියදා උතුරු ප්‍රදේශයේ සංචාරයක නිරත විය.

ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් ඒකකවල ක්‍රියාන්විත හා පාලන කටයුතු පිළිබඳ සොයාබැලීම මෙන්ම ඔවුන්ගේ අවශ්‍යතාවලට විසඳුම් ලබාදීම ඔහුගේ සංචාරයේ අරමුණ විය. සංචාරය අතරතුරු එම ඒකකවල අණදෙන නිලධාරීවරුන් ජ්‍යෙෂ්ඨ කොනොනීන් ඇතුලු සියලු නිලයන් අමතන්නටද හෙතෙම කටයුතු කරන ලදී.

---


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ

සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ

සෙ/2081045 ඉසෙ ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය







**අධීක්ෂණය**

බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිජී





**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ





**සහාය සංස්කාරක**

කපිතන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ





**සෝදුපත් කියවීම**

කපිතන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ














# රණවිරු හිතට සුවයක්...



රටෙහි පවතින වත්මන් තත්වය හේතුවෙන් සියලුම යුද්ධ හමුදා සාමාජිකයින් කඳවුරුවලට සීමාකොට වෙන්ව තැබීම සඳහා යොමුකර ඇති බැවින් ඇතැම් රණවිරුවන්ට දින ගණනාවක් තම ආදරණීයන්ගෙන් වෙන්ව සිටීමට සිදුව ඇත. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් යුතුව ඔවුන්ගේ චිත්ත ධෛර්යය නගාසිටුවීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

ඒ යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් රැඳී සිටි 4(සේවා) ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය - බොරුපන, පනාගොඩ බෝධිරාජාරාමය, සාමසාධක මෙහෙයුම් පුහුණු පාසල - කුකුලේගඟ, වතුපිටිවල යොවුන් සේනාංක මධ්‍යස්ථානය, රොලැක්ස් ගොඩනැගිල්ල - වත්තල, පනාගොඩ ක්‍රීඩා ගම්මානය, බියගම විලේජ් හෝටල් පරිශ්‍රය යන නිරෝධායන මධ්‍යස්ථානවලදී අදාළ දේශන හා වැඩමුළු පවත්වනු ලැබීය. ඒ සඳහා පූජ්‍ය දියසෙන්පුර විමල ස්වාමීන් වහන්සේ, ලින්ටන් ජෝසෆ් පියතුමන්, යෝගී උපදේශිකා අනෝජා වීරසිංහ මහත්මිය මෙන්ම මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ලුතිතන් කර්නල් බීජීඑස් සමන්ති, මේජර් ටීපීජීකේ ද අල්විස් ආර්ඩබ්ලිව්පී පීඑස්සී, නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ කර්නල් ආර්එම්එම් මොණරාගල යූඑස්පී ඇතුලු පිරිසක් එක්වූහ.




# අවැසි තැන... හරි වෙලාවට...



හැමදාටම හැමදේටම රණවිරුවෝ නැහැ
ඒත් අවැසි තැන හරි වෙලාවට ඔවුන් ඉන්නව.
ඒකට යුද්දෙද , ගංවතුරද , නියගෙද , නායයෑම්ද ,
සුනාමිද , වෛරස්ද කියලා වෙනසක් නෑ
රණවිරුවෝ ආවට ගියාට වැඩ කරන්නෙ නැහැ
ඒ වගේමයි ජනතාවගේ දුකේදී විපතේදී පිහිට වෙන්න
දෙපාරක් හිතන්නෙත් නෑ... ඒ ඔවුන්ගේ හැටි
රට වෙනුවෙන් ඔවුන්ට තියෙන "ගාය" ඒහෙමයි
පින්බිම සුරකින උත්තම කුලයෙ පුතුන්ට
රට බාරවෙලා තියෙන මොහොතක අවදානම දැනගෙන
අවබෝධයෙන් කටයුතු කරමු
මේ අභියෝගය අපට නිසැකවම ජයගත හැකියි.